# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2407/04 - 2024 ඔක්තෝබර් මස 22 වැනි අඟහරුවාදා - 2024.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 1/2005 (II)

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 160අ, 161ආ, 161ඇ, 161ඈ, 161ඉ, 161ඊ, 161උ, 161එ, 161ඔ සහ 161ඕ වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 204 වන වගන්තිය යටතේ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**හරිනි අමරසූරිය,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන,
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 22 දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2024 භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

**භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම**

2. පනත යටතේ භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීමට අදහස් කරන ඉල්ලුම්කරුවකු විසින්, මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන්, ඉල්ලුම් පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය ලේඛන සහ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු ද සමග, එකී කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

1A - PG 6907 — 454 (2024/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුව ද, දැනටමත් ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශකයකට සන්ධ්‍යාර්ථ දර්ශකයක් වන්නා වූ භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීමට අදහස් කරන ඉල්ලුම්කරුවකු විසින්, දැනටමත් ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශකවලින් තම ඉල්ලීම වෙනස් වන ප්‍රධාන සාධක සහ එම ලියාපදිංචි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැනටමත් ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශකය ව්‍යාකූල නොවන බවට එකී ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශකයට අදාළ භාණ්ඩ පරිභෝජනය කරන්නන්ට සහතික වීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදාගෙන ඇති ආරක්ෂක පියවර පිළිබඳ විස්තර එම ඉල්ලුම්පත්‍රය සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. (අ) 2 වන නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ඉල්ලුම් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති සියලු අවශ්‍යතා ඉල්ලුම්කරු විසින් සපුරා ඇත් ද යන්න නිසැකවම දැනගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(i) භූගෝලීය දර්ශක පිළිබඳ ක්ෂේත්‍රයේ යම් විශේෂඥයකුගෙන් උපදෙස් ලබා ගැනීම අවශ්‍ය බව සලකනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය;

(ii) ලියාපදිංචි කිරීමට අපේක්ෂිත භූගෝලීය දර්ශකයට අදාළ භූගෝලීය ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවක් සිදු කරනු ලැබිය හැකි ය; හෝ

(iii) ඉල්ලුම්පත්‍රය තහවුරු කිරීම පිණිස, ප්‍රදේශයේ විශේෂඥයින්ගෙන් යම් අවශ්‍ය ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරු වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කිරීමට පෙරාතුව, ඉල්ලුම් පත්‍රයේ හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරන ලද තහවුරු කිරීමේ ලේඛනවල නිශ්චිතව දක්වා ඇති යම් විස්තර සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

4. පනත යටතේ ලියාපදිංචි කිරීමට අපේක්ෂිත භූගෝලීය දර්ශකයක් වර්ග නාමයක් පත් වී තිබේ ද යන්න සලකා බැලීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එකී භූගෝලීය දර්ශකය සම්භවය වන ප්‍රදේශයේ, ස්ථානයේ හෝ පළාතේ එකී භූගෝලීය දර්ශකයේ පවත්නා තත්ත්වය සහ එකී භූගෝලීය දර්ශකයට අදාළ යම් භාණ්ඩ පරිභෝජනය කරන ප්‍රදේශය ඇතුළුව, එකී භූගෝලීය දර්ශකයට අදාළ සියලු සාධක සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

## II වන කොටස

### ඉල්ලුම් පත්‍රය පළ කිරීම සහ ලියාපදිංචිය සඳහා විරෝධය දැක්වීම

5. ලියාපදිංචි කිරීමට අපේක්ෂිත භූගෝලීය දර්ශකය පනතේ 161අ වන වගන්තිය ප්‍රකාරව අවේශ්‍ය වන බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එකී ඉල්ලුම් පත්‍රය ලැබීමේ දින සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

6. (අ) 5 වන නියෝගය යටතේ පළ කරන ලද භූගෝලීය දර්ශකය පනතේ 161අ වන වගන්තිය ප්‍රකාරව ආවේශ්‍ය නොවන බව සලකන යම් තැනැත්තකු විසින්, එකී පළ කිරීමේ දිනයේ සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත, එකී භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම සඳහා තම විරෝධය දැක්වෙන දැන්වීමක් මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග මෙහි තෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලබන්නේ නම් මිස, යම් කරුණු විභාග කිරීමක දී පනතේ 161ඇ වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ සාක්ෂි ලබා දෙන යම් තැනැත්තෙකු විසින්, එකී සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක ආකෘතියෙන් ලබා දිය යුතු අතර, ඉන්පසුව, පාර්ශ්වයන් විසින්, ලිඛිත දේශන තිබේ නම්, ඒවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දිනයක දී ගොනු කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම

7. (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පනතේ විධිවිධානවලට සහ මේ නියෝගවල විධිවිධානවලට යටත්ව, එකී භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම හෝ යම් සංශෝධන, කොන්දේසි හෝ සීමාකිරීම්වලට යටත්ව ලියාපදිංචි කිරීම හෝ ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු හේතු දක්වමින් එකී භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, භූගෝලීය දර්ශකයක සෑම ලියාපදිංචි හිමිකරුවකුම වෙත, හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ආකෘතියකින් භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමේ සහතිකය මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එකී සහතිකය සඳහා වන ගාස්තුව ලැබීමෙන් පසුව, නිකුත් කරනු ලැබිය යුතු ය.

8. (අ) භූගෝලීය දර්ශක රෙජිස්ටරයේ දක්නට ලැබෙන යම් මුද්‍රණ දෝෂයක් වෙනස් කිරීමේ කාර්යය සඳහා, කලින් කලට, සංශෝධනය කරනු ලැබිය හැකි භූගෝලීය දර්ශක රෙජිස්ටරයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තබා ගැනීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීමෙන්, යම් තැනැත්තකු විසින් භූගෝලීය දර්ශක රෙජිස්ටරය පරීක්ෂා කිරීම හෝ ඒ රෙජිස්ටරයේ සහතික කළ උධෘත පිටපත් ලබා ගැනීම කරනු ලැබිය හැකි ය.

9. අදාළ අවශ්‍යතා සපුරාලීමට යටත්ව, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍ර ලැබීමේ අනුපිළිවෙළ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රවලට අදාළ කටයුතු සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## ලියාපදිංචි කරන ලද භූගෝලිය දර්ශකවලට වෙනස් කිරීම් සිදු කිරීම

10. 161ඕ වන වගන්තියේ නිශ්චිව දක්වා ඇති යම් හේතුවක් සඳහා භූගෝලීය දර්ශකයක ලියාපදිංචි හිමිකරු විසින්, පිරිවිතර සහ සම්බන්ධිත පාලක සැලසුම සංශෝධනය කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු විසින්, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග මෙහි පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## ලියාපදිංචි කරන ලද භූගෝලීය දර්ශක අලුත් කිරීම

11. භූගෝලීය දර්ශකය හිමිකරුවකු විසින්, යම් භූගෝලීය දර්ශකයක ලියාපදිංචිය කල් ඉකුත් වීමට මාස හයකට පෙරාතුව, එකී භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග මෙහි හයවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, ඉල්ලුම්කරු විසින්, ලියාපදිංචිය කල් ඉකුත් වීමේ දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිව දක්වා ඇති අධිභාරයක් ගෙවීමෙන් පසුව ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

**අර්ථ නිරූපණය**

මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත අදහස් වේ;

"අනුයෝජිතයා" යන්නෙන්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 175 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද අනුයෝජිතයකු අදහස් වේ;

"ඉල්ලුම්කරු" යන්නට, පනතේ 161ආ වන වගන්තිය මගින් ඒ පදයට දි ඇති අර්ථයම තිබිය යුතු ය;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"භූගෝලීය දර්ශකය" යන්නට, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පාලක සැලසුම" යන්නට, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"භාණ්ඩ" යන්නට, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සන්ධිධාර්ථ භූගෝලීය දර්ශකය" යන්නෙන්, සමාන ලෙස අක්ෂර වින්‍යාසය දක්වනු ලබන හෝ උච්චාරණය කරනු ලබන, නමුත් වෙනස් ස්ථානවල, සාමාන්‍යයෙන් වෙනස් රටවල සම්භවය වන නිෂ්පාදන හඳුනාගනු ලබන යම් භූගෝලීය දර්ශකයක් අදහස් වේ; සහ

"මෙහෙයුම්කරු" යන්නෙන්, භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, එවැනි භාණ්ඩ වෙළෙඳපලේ ස්ථානගත කරන ක්‍රියාවලියෙහි නිරතව සිටින, එනම්, භාණ්ඩ වෙළඳාම, මිල දී ගැනීම සහ බෙදා හැරීම සිදු කරන යම් තැනැත්තකු අදහස් වේ.

**පළමුවන උපලේඛනය**

[2 වන නියෝගය]

**භාණ්ඩවල භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

| | |
|---|---|
| **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**<br><br>ඉල්ලුම්පත්‍රය ලැබුණු දිනය :<br>ගාස්තු ගෙවන ලද දිනය :<br>ඉල්ලුම් පත්‍ර අංකය : | |
| 1. **ඉල්ලුම්කරුගේ විස්තර** | |
| 1.1 නම : | |
| 1.2 තැපැල් ලිපිනය : | |
| ශ්‍රී ලංකාව තුළ දී ලිපිලේඛන භාරදීම සඳහා වූ තැපැල් ලිපිනය (ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්) | |
| 1.3 දුරකථන අංකය : | 1.4 ෆැක්ස් අංකය : |
| 1.5 විද්‍යුත් තැපැල් ලිපිනය : | 1.6 ජාතිකත්වය : |
| 2. **ඉල්ලුම්කරුගේ නියෝජ්‍යත්වය** | |
| ඉල්ලුම්කරු තැනැත්තන්ගේ සංගමයක් වන්නේ නම් කරුණාකර පහත දැක්වෙන ලේඛන අමුණන්න :-<br><br>(අ) භූගෝලීය දර්ශකය භාවිත කිරීමට සුදුසුකම් ලබන සියලු නිෂ්පාදකයන්ට ස්වයංක්‍රීයව සාමාජිකත්වය පිරිනැමෙන බවට විධිවිධාන සැලැස්විය යුතු සංගමයේ ව්‍යවස්ථාවේ සහතික කරන ලද පිටපතක්; සහ<br><br>(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක්. | |
| 3. **යම් භාණ්ඩයක් භූගෝලීය දර්ශකයක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී හඳුන්වාගනු ලබන නිෂ්පාදකයන්ගේ ලැයිස්තුව** | |
| 4. **භූගෝලීය දර්ශකයේ පිරිවිතර** | |
| 4.1 භූගෝලීය දර්ශකයේ නම : | |
| 4.2 භාණ්ඩ වර්ග<br>(අ) කෘෂිකාර්මික භාණ්ඩ<br>(ආ) ආහාර ද්‍රව්‍ය<br>(ඇ) අත්කම් භාණ්ඩ<br>(ඈ) වෙනත් භාණ්ඩ | |

| | |
|---|---|
| 4.3 | භාණ්ඩය පිළිබඳ විස්තරය (භාණ්ඩයේ භෞතික, රසායනික, ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක හෝ අංගජනනාත්මක ලක්ෂණ මෙන්ම අදාළ වන්නේ නම්, අමුද්‍රව්‍ය ද ඇතුළත්ව). |
| 4.4 | හඳුනාගත් භූගෝලීය ප්‍රදේශය තුළ සිදුවන නිෂ්පාදනයේ, පිරිසැකසුම් සැකසුම් කිරීමේ විශේෂිත පියවර පිළිබඳ විස්තරය. |
| 4.5 | භූගෝලීය සිතියම සහිත භූගෝලීය ප්‍රදේශය පිළිබඳ විස්තරය. |
| 4.6 | භූගෝලීය දර්ශකයක ආවේණික, ස්වභාවික හෝ මානව සාධක සමග භූගෝලීය පරිසරයට අනන්‍ය වූ හෝ අත්‍යවශ්‍ය වූ විශේෂිත ගුණාංගය, කීර්ති නාමය හෝ වෙනත් ලක්ෂණය සම්බන්ධයෙන් අදාළ භූගෝලීය ප්‍රදේශයෙන් සම්භවය වන භාණ්ඩ නම් කිරීම සඳහා භූගෝලීය දර්ශකයක් ප්‍රයෝජනවත් වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ප්‍රකාශයක් (එකී විස්තර භූගෝලීය ප්‍රදේශය තුළ භාණ්ඩය නිෂ්පාදනය කිරීම පිළිබඳ ඉතිහාසයට සහ භාණ්ඩලයට විශේෂත්වය ලබා දෙන මානව හෝ ස්වභාවික සාධකවල විශේෂත්වයට අදාළ විය හැකි ය.) |
| 4.7 | භූගෝලීය දර්ශකයක දැනටමත් ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශකයකට සන්ධිධාර්ථ භූගෝලීය දර්ශකයක් වන අවස්ථාවක දී, ඉල්ලුම්කරු විසින් පහත දේ දැක්විය යුතු ය :- |
| | (අ) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි භූගෝලීය දර්ශකවලින් වෙනස් වීමේ ප්‍රධාන සාධක ; සහ<br>(ආ) එකී ලියාපදිංචි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකී භාණ්ඩ පරිභෝජනය කරන්නන් ව්‍යාකූල වීම හෝ නොමග යැවීම සිදු නොවන බව සහතික කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදාගෙන ඇති ආරක්ෂක පියවර පිළිබඳ විස්තර. |
| 4.8 | විදේශීය භූගෝලීය දර්ශකයක් සම්බන්ධයෙන් වන විට දී, භූගෝලීය දර්ශකය දැනටමත් සම්භවය ලද රටෙහි ලියාපදිංචි කරනු ලැබ ඇති බවට හෝ එම රටේ අභාවිතයට නොවැටෙන බවට, අදාළ රටේ රජයෙන් ලබාගන්නා නිල ලේඛනයක් ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතු ය. |
| 4.9 | භූගෝලීය දර්ශකයයේ මුහුණුවර වචනවලින් හෝ සංඛ්‍යාත්මක මූලාංගවලින් හෝ දෙයාකාරයෙන්ම සමන්විත වන්නේ ද යන්න දැක්වෙන භූගෝලීය දර්ශකයේ මුහුණුවරට අදාළ යම් විස්තර |

| |
|---|
| 4.10 උපරිම වචන ගණන පන්සියයකින් යුක්ත වන පිරිවිතර පිළිබඳ සාරාංශයක් |
| **5. භූගෝලීය දර්ශකයේ පාලක සැලැස්ම** |
| 5.1 නිෂ්පාදකයන්ට බලය පැවරීම සඳහා වන කාර්ය පටිපාටිය : |
| 5.2 නිෂ්පාදන ක්‍රමවේදයේ සහ පාලනය කළ යුතු නිෂ්පාදනයේ පිරික්සුම් ලක්ෂ්‍ය ලැයිස්තුව : |
| 5.3 එක් එක් පිරික්සුම් ලක්ෂ්‍යයේ දී පාලන ක්‍රමවේදය (නිෂ්පාදන භූමිය, ලේබන, නිෂ්පාදනයේ විද්‍යාගාර විශ්ලේෂණය, නිෂ්පාදනයේ ඉන්ද්‍රයික විශ්ලේෂණය යනාදිය පරීක්ෂා කිරීම): |
| 5.4 එක් එක් පිරික්සුම් ලක්ෂ්‍යයේ දී පාලනය කරනු ලැබිය යුතු නිෂ්පාදකයන් සහ මෙහෙයුම්කරුවන්: |
| 5.5 එක් එක් පිරික්සුම් ලක්ෂ්‍යයේ දී පාලනයේ ආවර්තිතාව: |
| |
| 5.6 එක් එක් පිරික්සුම් ලක්ෂ්‍යයේ දී පාලනය භාර තැනැත්තා: |
| 5.7 එක් එක් පිරික්සුම් ලක්ෂ්‍යයේ දී අනනුකූලතාවක් සම්බන්ධයෙන් වන දණ්ඩන: |
| **6. සම්භවය වන රටෙහි භූගෝලීය දර්ශකයේ ආරක්ෂාව පිළිබඳ සාක්ෂිය (ඉල්ලුම් පත්‍රය විදේශීය භූගෝලීය දර්ශකයක් සඳහා වන්නේ නම්)** |

<table>
<tr><td colspan="2">7. අනුයෝජිතයා, සිටී නම්<br>(කරුණාකර ඇටෝර්නි බලපත්‍රය අමුණන්න)</td></tr>
<tr><td colspan="2">7.1 නම :</td></tr>
<tr><td colspan="2">7.2 තැපැල් ලිපිනය :</td></tr>
<tr><td>7.3 දුරකථන අංකය :</td><td>7.4 ෆැක්ස් අංකය :</td></tr>
<tr><td>7.5 විද්‍යුත් තැපැල් ලිපිනය :</td><td></td></tr>
<tr><td colspan="2">8. ප්‍රකාශනය</td></tr>
<tr><td colspan="2">මම, ඉහත සඳහන් භාණ්ඩ භූගෝලීය දර්ශකයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා මෙයින් ඉල්ලුම් කරන අතර මේ ඉල්ලුම්පත්‍රයේ ලබා දී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි.</td></tr>
<tr><td>නම</td><td>තනතුර</td></tr>
<tr><td>අත්සන<br><br>(ඉල්ලුම්කරු තැනැත්තන්ගේ සංගමයක් හෝ සංවිධානයක් හෝ අධිකාරයක් වන්නේ නම් බලයලත් අත්සන සහ මුද්‍රාව)</td><td>දිනය</td></tr>
</table>

**දෙවන උපලේඛනය**

**[2,5,6,7,8,10 සහ 11 වන නියෝගය]**

**ගාස්තු**

| වගන්තිය/නියෝගය | විස්තරය | ගාස්තුව (රුපියල්) |
|---|---|---|
| 161ආ (1) වන වගන්තිය<br><br>2 වන නියෝගය | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 20,000.00 |
| 161ඇ (1) වන වගන්තිය<br><br>5 වන නියෝගය | ඉල්ලුම් පත්‍රය *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා වන ගාස්තුව<br>(භූගෝලීය දර්ශක සළකුණේ නිර්මාණය සහ ප්‍රමාණය නොසළකා) | 8,000.00 |
| 161ඇ (1) වන වගන්තිය<br><br>6(අ) වන නියෝගය | විරෝධය දැක්වීමේ සඳහා වන ගාස්තුව | 10,000.00 |
| 161ඊ වන වගන්තිය<br><br>7(ආ) වන නියෝගය | ලියාපදිංචි කිරීමේ සහතිකය සඳහා වන ගාස්තුව | 2,000.00 |
| 161උ (3) වන වගන්තිය<br><br>8(ආ) වන නියෝගය | භූගෝලීය දර්ශක රෙජිස්ටරය පරීක්ෂා කිරීමේ ගාස්තුව | 50.00 |
| | භූගෝලීය දර්ශක රෙජිස්ටරයේ සහතික කරන ලද උධෘත පිටපත් ලබා ගැනීමේ ගාස්තුව | A4 ප්‍රමාණයේ පිටුවක් හෝ එහි කොට-සක් සඳහා - 150.00<br><br>එක් එක් අමතර පිටුවක් හෝ කොටසක් සඳහා - 75.00 |
| 161ඕ වන වගන්තිය | පිරිවිතර සහ සම්බන්ධිත පාලක සැලසුම සංශෝධිනය කිරීමේ ගාස්තුව | 5,000.00 |
| 161ඉ (2) වන වගන්තිය<br>11 වන නියෝගය | පරිපාලන ගාස්තුව (අලුත් කිරීම සඳහා) | 15,000.00 |
| 161ඉ (2) වන වගන්තිය<br><br>11 වන නියෝගය | අලුත් කිරීම සඳහා පරිපාලන ගාස්තුව මත වන අධිභාරය | පරිපාලන ගාස්තුවෙන් 10% ක් |
| 161ආ (5) වන සහ 161 ඇ (4) වන<br><br>වගන්ති | විභාග කිරීමේ ගාස්තුව (එක්දිනකට) | 5,000.00 |
| 161ආ (3) වන සහ 161ආ (7) වන වගන්ති | අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණ සඳහා හේතු ඉදිරිපත් කිරීම | 10,000.00 |

**තුන්වන උපලේඛනය**

**[6(අ) වන නියෝගය]**

**භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම සඳහා විරෝධය දැක්වීමේ දැන්වීම**

| | |
|---|---|
| **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**<br><br>දැන්වීම් ලැබුණු දිනය :<br>ගාස්තු ගෙවන ලද දිනය :<br>ලදුපත් අංකය : | |
| 1. **විරෝධය දක්වන්නා පිළිබඳ විස්තර** | |
| 1.1 නම : | |
| 1.2 තැපැල් ලිපිනය : | |
| ශ්‍රී ලංකාව තුළ දී ලිපිලේඛන භාරදීම සඳහා වූ තැපැල් ලිපිනය (විරෝධය දක්වන්නා ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්) | |
| 1.3 දුරකථන අංකය : | 1.4 ෆැක්ස් අංකය : |
| 1.5 විද්‍යුත් තැපැල් ලිපිනය : | 1.6 ජාතිකත්වය : |
| 2. **විරෝධතාව දැක්වූ ඉල්ලුම්පත්‍රයේ විස්තර** | |
| 2.1 ඉල්ලුම්පත්‍රයේ අංකයː | |
| 2.2 ගැසට් නිවේදනයේ දිනය සහ අංකයː | |
| 2.3 විරුද්ධ වීමේ හේතු සහ අවශ්‍ය සාක්ෂිː<br>(අවශ්‍ය වන්නේ නම් අමතර පිටු එකතු කරන්න) | |
| 3. **අනුයෝජිතයා, සිටී නම්**<br>**(කරුණාකර ඇටෝර්නි බලපත්‍රය අමුණන්න)** | |
| 3.1 නමː | |
| 3.2 තැපැල් ලිපිනයː | |
| 3.3 දුරකථන අංකයː | 3.4 ෆැක්ස් අංකය : |
| 3.5 විද්‍යුත් තැපැල් ලිපිනයː | |
| 4. **ප්‍රකාශනය** | |
| මම, ඉහත සඳහන් භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම සඳහා විරෝධතාව දැක්වෙන දැන්වීම මෙයින් ඉදිරිපත් කරන අතර මේ දැන්වීමේ ලබා දී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම මෙයින් සහතික කරමි. | |
| නම | තනතුර |
| අත්සන<br><br>(විරෝධය දක්වන්නා පුද්ගල සංගමයක් හෝ සංවිධානයක් හෝ අධිකාරියක් වන්නේ නම් බලයලත් අත්සන සහ මුද්‍රාව) | දිනය |

**හතරවන උපලේඛනය**

**[7(ආ) වන නියෝගය]**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 161ඊ වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ සහතිකය

භූගෝලීය දර්ශක අංකය ..................................................... සහතිකයේ අංකය .....................................................

..................................................... සම්බන්ධයෙන් ..................................................... පන්තියට අයත් ..................................................... ට අදාළ ..................................................... දිනට අංක ..................................................... යටතේ ..................................................... පන්තියෙහි ..................................................... නමින් භූගෝලීය දර්ශක රෙජිස්ටරයෙහි භූගෝලීය දර්ශකය (එහි නියෝජනයක් මේ සමග අමුණා ඇත) ලියාපදිංචි කර ඇති බවට සහතික කරනු ලැබේ.

මාගේ විධානය මත 20 .......................... මස .............................. වන දින ශ්‍රී ලංකාවේ කොළඹ දී මුද්‍රා තබන ලදී.

..................................................................

බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,

3 වන මහල,

'සමාගම් මැදුර',

අංක 400,

ඩී. ආර්. විජේවර්ධන මාවත,

කොළඹ 10,

ශ්‍රී ලංකාව.

**පස්වන උපලේඛනය**

[10 වන නියෝගය]

**පිරිවිතර සහ සම්බන්ධිත පාලක සැලැස්ම සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කිරීම**

| | |
|---|---|
| **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**<br><br>ඉල්ලීම ලැබුණු දිනය ඃ<br>ගාස්තු ගෙවන ලද දිනය ඃ<br>ලදු පත් අංකය ඃ | |
| 1. **භූගෝලීය දර්ශකයේ විස්තර ඃ-** | |
| 1.1 භූගෝලීය දර්ශකයේ අංකය ඃ | 1.2 පන්තිය ඃ |
| 1.3 ඉල්ලීමට අදාළ සටහන් හෝ විස්තර ඃ | |
| 2. **ලියාපදිංචි හිමිකරු පිළිබඳ විස්තර** | |
| 2.1 නමඃ | |
| 2.2 තැපැල් ලිපිනයඃ | |
| ශ්‍රී ලංකාව තුළ දී ලිපිලේඛන භාරදීම සඳහා තැපැල් ලිපිනය (ලියාපදිංචි හිමිකරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්) | |
| 2.3 දුරකථන අංකයඃ | 2.4 ෆැක්ස් අංකය ඃ |
| 2.5 විද්‍යුත් තැපැල් ලිපිනයඃ | 2.6 ජාතිකත්වය ඃ |
| 3. **අනුයෝජිතයා, සිටී නම්**<br>**(කරුණාකර ඇටෝර්නි බලපත්‍රය අමුණන්න)** | |
| 3.1 නමඃ | |
| 3.2 තැපැල් ලිපිනයඃ | |
| 3.3 දුරකථන අංකයඃ | 3.4 ෆැක්ස් අංකය ඃ |
| 3.5 විද්‍යුත් තැපැල් ලිපිනයඃ | |
| 4. **ප්‍රකාශනය** | |
| ඉහත සඳහන් භූගෝලීය දර්ශකය පිළිබඳ විස්තර සංශෝධනය කිරීම සඳහා මම මෙයින් ඉල්ලුම් කර සිටින අතර මේ ඉල්ලීමෙහි ලබා දී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මෙයින් සහතික කරමි. | |
| නම | තනතුර |
| අත්සන<br><br>(ලියාපදිංචි හිමිකරු පුද්ගල සංගමයක් හෝ සංවිධානයක් හෝ අධිකාරියක් වන්නේ නම් බලයලත් අත්සන සහ මුද්‍රාව) | දිනය |

**හයවන උපලේඛනය**

[11 වන නියෝගය]

**භූගෝලීය දර්ශකයක ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

| | |
|---|---|
| **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**<br><br>ඉල්ලුම්පත්‍රය ලැබුණු දිනය ඃ<br>ගාස්තු ගෙවන ලද දිනය ඃ<br>ඉල්ලුම්පත්‍ර අංකය ඃ | |
| 1. **ලියාපදිංචි අංකයඃ** | |
| 2. **පන්තියඃ** | |
| 3. **ලියාපදිංචි හිමිකරු පිළිබඳ විස්තර** | |
| 3.1 නමඃ | |
| 3.2 තැපැල් ලිපිනයඃ | |
| ශ්‍රී ලංකාව තුළ දී ලිපිලේඛන භාරදීම සඳහා තැපැල් ලිපිනය (ලියාපදිංචි හිමිකරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්) | |
| 3.3 දුරකථන අංකයඃ | 3.4 ෆැක්ස් අංකය ඃ |
| 3.5 විද්‍යුත් තැපැල් ලිපිනයඃ | 3.6 ජාතිකත්වය ඃ |
| 4. **ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද දිනයඃ** | |
| 3. **අනුයෝජිතයා, සිටී නම්**<br>**(කරුණාකර ඇටෝර්නි බලපත්‍රය අමුණන්න)** | |
| 5.1 නමඃ | |
| 5.2 තැපැල් ලිපිනයඃ | |
| 5.3 දුරකථන අංකයඃ | 5.4 ෆැක්ස් අංකය ඃ |
| 5.5 විද්‍යුත් තැපැල් ලිපිනයඃ | |
| 6. **අදාළ වන්නේ නම්, අධිභාර ඇතුළුව ගෙවන ලද ගාස්තුඃ** | |
| 7. **ප්‍රකාශනය** | |
| ඉහත සඳහන් භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මම මෙයින් ඉල්ලුම් කරන අතර මේ ඉල්ලුම්පත්‍රයේ දී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මෙයින් සහතික කරමි. | |
| නම | තනතුර |
| අත්සන<br><br>(ලියාපදිංචි හිමිකරු පුද්ගල සංගමයක් හෝ සංවිධානයක් හෝ අධිකාරියක් වන්නේ නම් බලයලත් අත්සන සහ මුද්‍රාව) | දිනය |

EOG 10 - 0200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.